**බේරුවල නගර සභාව - 2023**

**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බේරුවල නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බේරුවල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

1.6.1 **ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ නිම කරන ලද වෙත්තිම රාජපුර පාලම ඉදි කිරීම (11 අදියර ) හා ජොසප් කුරේ මාවත සංවර්ධනය වෙනුවෙන් වැය කළ පිළිවෙලින් රු.1,241,255 ක් හා රු.1,007,821 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් තබන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෞද්ගලික ආයතනයකට ගෙවිය යුතු රු.647,217 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.1,151,567 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව. | -එම- |
| (ඇ) සේවකයින් 27 දෙනෙකුගෙන් වැටුප් රහිත නිවාඩු ලෙස ලැබිය යුතු රු.141,510 ක් මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) සමාලෝචිත වර්ෂය සඳහා යන්ත්‍ර, කාර්යාල උපකරණ ,ලී බඩු , බඳුන් හා උපකරණ සහ පුස්තකාල පොත් යන වත්කම් 05 කට අදාල වාර්ෂික ක්ෂය එකතුව රු.11,424 ක් අඩුවෙන්ද, සවි කිරීම් , මෝටර් රථ සහ පාරවල් බොක්කු යන | නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් තබන බව. | -එම- |

| | | |
|---|---|---|
| වත්කම් 03 ට අදාල වාර්ෂික ක්ෂය එකතුව රු.553,993 ක් වැඩියෙන් ද ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශයේ රු.11,584,802 ක් වූ මුදල් පොතේ ශේෂය දැක්විය යුතු වුවත්, රු.15,490,084 ක් වූ බැංකු ගිණුම් ශේෂය දක්වා තිබුණි. | ගිණුමේ බැංකු ප්‍රකාශයේ ශේෂය දක්වා ඇති බව. | ගිණුමේ මුදල් පොත අනුව මුදල් ශේෂය දැක්විය යුතුය. |
| (ඊ)සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයුර්වේද භාණ්ඩ තොගය ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් තබන බව. | දෙසැම්බර් 31 දිනට තොග ගණනය කර නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) 2022 වර්ෂයේදී අපහරණය කරන ලද එකතුව රු.1,824,000 ක් වූ ට්‍රේලර් 08 කට අදාලව රු.143,002 ක් වූ සමුච්චිත ක්ෂය, ක්ෂය වෙන් කිරීමේ ගිණුමෙන් ඉවත් කර නොතිබුණි. | -එම- | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එක් ගිණුම් විෂයයක ශේෂ පිරික්සුමේ ශේෂය හා ලෙජර් ගිණුමේ ශේෂය අතර රු.3,927,410 ක වෙනසක් විය. | 2024 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව. | වෙනසට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| **විෂය** | **මුදල රු.** | **නොසැපයූ විගණන සාක්ෂි** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| i ඉදිරියට කල ගෙවීම් | 509,650 | උපලේඛන | ඉදිරියේදී මෙම ශේෂ පිළිබඳ කටයුතු කරන බව. | ලේඛන පිළියෙල කර පවත්වාගෙන යා යුතු වේ. |
| ii ලැබිය යුතු වැට් | 384,970 | උපලේඛන | -එම- | -එම- |
| iii අත්තිකාරම් | 104,244 | උපලේඛන | -එම- | -එම- |
| iv පළාත් සභා ණය | 492,750 | උපලේඛන | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.502,179 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.12,368,388 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 20,906,576 | 20,906,576 | 13,698,866 | 16,205,642 | 15,208,192 | 15,208,192 | 16,305,655 | 17,612,107 |
| (ii) | කුලී | 22,546,242 | 22,546,242 | 15,333,131 | 10,448,792 | 26,009,270 | 26,009,270 | 26,537,046 | 4,505,078 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,806,800 | 1,806,800 | 1,781,600 | 78,200 | 200,000 | 200,000 | 106,000 | 137,000 |
| (iv) | වෙනත් ආදායම් | - | - | - | - | 2,233,200 | 2,233,200 | 2,824,824 | 966,971 |
| | | 45,259,618 | 45,259,618 | 30,813,597 | 26,732,634 | 43,650,662 | 43,650,662 | 45,773,525 | 23,221,156 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් බදු හිඟය රු.17,612,107ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු,8,772,609 ක් හෙවත් සියයට 49 ක් අයකර නොතිබුණි. | හිඟ අය කිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) කුලී** | | |
| සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ කඩ කුලීය රු.4,505,078ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු,3,235,682 ක් හෙවත් සියයට 72 ක් අයකර නොතිබුණි. | නීතිමය ක්‍රියා මාර්ග ගෙන ඇති බව. | -එම- |

**(ඇ) බලපත්‍ර ගාස්තු**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ ව්‍යාපාර බදු රු.272,400 ක් වූ අතර වර්ෂය තුල ඉන් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. | -එම- | -එම- |

**(ඇ) වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු. 10,793,535 ක් විය. | උපලේඛන සකස් කර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බව. | -එම- |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යනාදිය සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) හලවල වෙත්තිමරාජපුර ඉඩමේ කසළ තුනී කිරීම සඳහා චේන් ලෝඩරය කුලියට ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල රු.1,580,970 ක් වැය කර තිබූ අතර කසළ අංගනයක් නොමැති වීමෙන් දිරන කසළ මගින් කොම්පෝස්ට් නිෂ්පාදනය කර නොතිබුණි. | කොම්පෝස්ට් සෑදීම සඳහා කසළ අංගනයක් නොමැති බව. | කසළ වියදම අවම කර ගනිමින් කසළ කළමනාකරණයට පියවර ගත යුතුය. |
| (ආ) 2015 දෙසැම්බර් 28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස මස් අලෙවි කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් නොකළ යුතු වුවත් අදාල කොන්දේසි සපුරා නොතිබූ මස් කඩ 07 කට 2023 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා මස් අලෙවි කිරීම සඳහා බලපත්‍ර ලබා දී තිබුණි. | අතුරු ව්‍යවස්ථාවේ කොන්දේසි කඩවීම මත බලපත්‍ර අවලංගු කරන ලද බව | කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස බලපත්‍ර නිකුත් නොකළ යුතුය. |

### 3.2 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බේරුවල නගර සභාවේ සභාපතිවරයා විසින් බේරුවල නගර සභා බල ප්‍රදේශයට අයත් නොවන බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් මාර්ගයක් සංවර්ධනය කිරීමට අදාලව 2022 අප්‍රේල් 06 දිනැති අංක ACLGK/D3/De//01 දරන පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ ලිපියෙන් නගර සභා ආඥා පනතේ 184 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කරන ලෙස දන්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණු අතර සභාපතිවරයා විසින් පෞද්ගලිකව සිදු කරන ලද ඉහත සංවර්ධන කටයුත්තට එරෙහිව බාහිර පාර්ශවයක් විසින් නගර සභාවට පවරා තිබූ නඩු වෙනුවෙන් 2020 වර්ෂයේ සිට 2023 පෙබරවාරි මස දක්වා සභා අරමුදලින් රු.254,000 ක් නඩු ගාස්තු ලෙස ගෙවා තිබුණි. | පළාත් පාලන කොමසාරිස්වරයාට ඉදිරිපත් කර ඇති බව හා නඩු තීන්දුවට පසුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් පසු විපරම් කළ යුතු අතර සභා අරමුදලින් සභාපතිගේ පෞද්ගලික වියදම් දැරිය නොහැක. |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1980 සැප්තැම්බර් 09 දිනැති අංක 105/03 අති විශේෂ ගැසට් පත්‍රය මගින් බේරුවල තානායමේ පාලනය නාගරික සංවර්ධන අධිකාරියට ලබා දී තිබුණද ඒ සඳහා ඇති කරගත් ලිඛිත ගිවිසුමක් සභාව සතු නොවීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ තානායම් කුලී රු.1,157,116 ක් නොගෙවීමට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට සභාවට නොහැකි වී තිබුණි. | ලේඛනාගාරයේ ඇති වූ ගින්න නිසා සියළුම ලේඛන විනාශ වී ඇති බව. | තානායම් ගාස්තු අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සභාවේ පොදු වෙළඳ පොල තුල 2016 වර්ෂයේ සිට ගිවිසුම්ගත නොවූ කඩ කාමර 03 ක් විය. | නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන බව. | කඩ කාමර බදුදීමට ප්‍රථම ගිවිසුම්ගත විය යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) පොදු වෙළඳ පොල මස් කඩය සඳහා 2023 වර්ෂයේ අප්‍රේල් සිට ඔක්තෝබර් දක්වා අයවිය යුතු රු.3,454,500 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අය කර ගෙන නොතිබුණි. | -එම- | කඩ කාමර කුලී කඩිනමින් අයකර ගත යුතුය. |

3.5 **නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.1,075,410 ක් වටිනා කායවර්ධන උපකරණ සහිත බේරුවල, මරදාන පිහිටි කායවර්ධන මධ්‍යස්ථානය කායවර්ධන පුහුණුකරුවෙකු නොමැතිවීම හේතුවෙන් 2022 වර්ෂයේ සිට නිශ්කාර්යව පවතින අතර කායවර්ධන උපකරණ සෘජුවම මුහුදු සුළං‍වලට නිරාවරණය වීම හේතුවෙන් මළ බැඳීමකට ලක්වීමේ අවදානමක් ද පැවතුණි. | ඉදිරියේදී ක්‍රියා මාර්ග ගැනීමට බලාපොරොත්තු වෙන බව. | කායවර්ධන මධ්‍යස්ථානයට පුහුණුකරුවෙකු යොදා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

3.6 **වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2012 වර්ෂයේ සිට සභාව භාවිතා කරන ලද කැබ් රථයක් සභාව නමට පවරා ගෙන නොතිබුණි. | පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය ලේඛන ඉදිරිපත් කර ඇති බව | වත්කම් සභාව නමට පවරා ගත යුතුය. |